# ජපානයේ ජීවත් වීමේදී පිලිපැදිය යුතු නීති රීති

~ ජ්‍යෙෂ්ඨයෙක් කියනදෙයට සවන්දී බලමු ~

**එදිනෙදා ජීවිතයට අදාළ වන මූලික නීති**

1. කුණු දැමීම සම්බන්ධව
2. ශබ්දය ගැන සැලකිලිමත් වීම සම්බන්ධව
3. වයස අවුරුදු 20 ට අඩු අයට දුම්පානය තහනම් /මත්පැන්පානය තහනම්
4. බයිසිකලයක් පැදීමට අදාළ නීති සම්බන්ධව
5. වෙනත් කරුණු

**ක්‍රියාපටිපාටි ගැනීමට අවශ්‍ය වන කාරණා සම්බන්ධව**

1. පදිංචිය වෙනස් කිරීමේදී ගතයුතු ක්‍රියාපටිපාටි සම්බන්ධව
2. ජාතික සෞඛ්‍ය රක්ෂණය සම්බන්ධව
3. ජාතික විශ්‍රාම වැටුප සම්බන්ධව
4. වීසා සම්බන්ධව
5. ඔබට තිබෙන වීසා වර්ගයට අදාල නොවන බාහිර ක්‍රියාකාරකම්වල යෙදීම සඳහා අවශ්‍ය බලපත්‍රය සම්බන්ධව
6. 【ප්‍රයෝජනවත් වෙබ් අඩවි】

# කුණු දැමීම සම්බන්ධව

- වෙන්කරන්න
- අදාලවන බැගයට දමා ඉවත දමන්න
- නියමිත දිනයට සහ වේලාවට ඉවත දමන්න
- විශාල ගණයේ අපද්‍රව්‍ය සහ ගෘහ උපකරණ සඳහා ගාස්තු අය කෙරේ



# ශබ්දය ගැන සැලකිලිමත් වීම සම්බන්ධව

- රාත්‍රී කාලයේදී සහ උදෑසන විශේෂයෙන් ප්‍රවේශම් වන්න
- මහල් නිවාසවල ශබ්දය සන්බන්දව බොහෝ ගැටළුව ඇතිවේ
- සින්දු වලට සවන්දෙනවිට සහ රූපවාහිනිය නරබනවිට ශබ්දය පාලනය කරන්න
- මහල් නිවාස ගොඩනැගිලි තුළදී අඩි ශබ්ද සහ අනෙකුත් ශබ්ද ගැන සැලකිලිමත් වන්න



# වයස අවුරුදු 20 ට අඩු අයට දුම්පානය තහනම් /මත්පැන්පානය තහනම්

- දුම් පානය , මත්පැන්පානය කල හැක්කේ වයස අවුරුදු 20සෙන් පසුවය
- වයස අවුරුදු 20 දක්වා මිලදී ගැනීම සහ ළඟ තබා ගැනීමද තහනම්ය



# බයිසිකලයක් පැදීමට අදාළ නීති සම්බන්ධව

- බයිසිකලයද 「වාහනයක්」 ලෙස සැලකේ
- වාහන මාර්ගයේ වම්පසින් ධාවනය කල යුතුය
- පදික වේදිකාවේ ධාවනය කරන විට, පදිකයින්ට ප්‍රමුඛත්වය දියයුතුය
- බයිසිකලයේ ඉදිරිපස විදුලි පහන් සහ පිටුපස පරාවර්තකයක් සවිකල යුතුය
- හිස්වැස්මක් පැළඳ ආරක්ෂිත වේගයකින් පැදවිය යුතුය
- මත්පැන් පානය කර පැදවීම තහනම්ය




# වෙනත් කරුණු

- බාබෙක්යු එකක් කිරීමේදී එම ස්ථානය ඊට අවසරයක් ඇති ස්ථානයක්ද කියා බලන්න
- අධික ශබ්ද නැගීම සහ අධික ශබ්දයෙන් කතා කිරීමෙන් වලකින්න
- තමන්ගේ කුණු ගෙදර ගෙනයා යුතු අතර අදාල ප්‍රදේශයේ නීති නිසියාකාරව පිළිපදින්න



# ක්‍රියාපටිපාටි ගැනීමට අවශ්‍ය වන කාරණා සම්බන්ධව

- පදිංචිය වන  ස්ථානය තීරණය කල පසු අදාල ප්‍රදේශයේ පළාත් පාලන කාර්යාලයට දැනුම් දෙන්න
- පදිංචියට වෙනස් කරන විට, කලින් පදිංචිවසිටි ස්ථානයේ අදාල නගර කාර්යාලයට 「ස්ථාන මාරුකිරීමේ නිවේදනය」 බාරදිය යුතුය
- ⇒ පදිංචියට වෙනස් කල පසු , නව පදිංචි ස්ථානයට අදාල නගර කාර්යාලයට 「පදිංචියට ආ නිවේදනය」 බාරදිය යුතුය
- අදාල නගර කාර්යාලයට ගොස් නේවාසික බද්ද, ජාතික සෞඛ්‍ය රක්ෂණය ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාපටිපාටි සිදුකරන්න



# ජාතික සෞඛ්‍ය රක්ෂණය සම්බන්ධව

- ජපානයේ වෙසෙන සැමට රජයෙන් ලැබෙන සේවාවක්ය
- වෛද්‍ය වියදම් වල අර්ධයක් ආවරණයවේ
- රෝහල් සහ සායනවලදී එම වරප්‍රසාදය ලබාගත හැකිය
- අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය ඔබගේ ප්‍රදේශයට අදාල නගර කාර්යාලයට ගොස් සිදුකල යුතුය
- රක්ෂණයේ ගෙවීම ඔබගේ ශුද්ධ ආදායම අනුව තීරණයවේ



## ජාතික විශ්‍රාම වැටුප සම්බන්ධව

- ජපානයේ වසන වයස අවුරුදු 20 හෝ ඊට වැඩි ඕනෑම අයෙකු ඇතුල් විය යුතුය
- ශුද්ධ ආදායම, වයස ආදිය මත එයට අතුල්වීමට අවශ්‍ය නොවන අවස්ථාද ඇත
- රැකියාවක නිරත වන්නේනම්, ඔබ ස්වයංක්‍රීයව එයට ඇතුලත්ව සිටී
- ස්වයං රැකියාවක නිරත වන්නේනම් හෝ රැකියා විරහිත නම් ප්‍රදේශයට අදාල නගර කාර්යාලයට ගොස් එයට අවශ්‍ය ක්‍රියා පටිපාටිය ඔබ විසින් සිදුකල යුතුය

# වීසා සම්බන්ධව

- ජපානයේ රැකියාවක් කිරීම, ඉගෙනීම සහ ඔබේ පවුලේ අය සමඟ රැඳී සිටීම සඳහා අවශ්‍ය කොන්දේසි
- ඔබගේ වීසා එක ඉදිරියටත් තබා ගැනීම  සඳහා, ඔබගේ වීසා කාලය ඉකුත්  වීමට පෙර එය දික්කිරීමේ ක්‍රියා පටිපාටිය කළ යුතුය
- ජපානයේ රැඳී සිටීමේ අරමුණ හෝ ඔබ සිටින තත්වයේ වෙනසක් වුවහොත්, යම් ක්‍රියා පටිපාටියක් අවශ්‍ය දැයි සොයා බැලීමට වග බලා ගන්න
- අදාල ක්‍රියා පටිපාටි සහ ඒ පිළිබඳ විමසීම් ආගමන විගමන කාර්යාලය හරහා සිදු කරන්න

# ඔබට තිබෙන වීසා වර්ගයට අදාල නොවන බාහිර ක්‍රියාකාරකම්වල යෙදීම සඳහා අවශ්‍ය බලපත්‍රය සම්බන්ධව

- වීසා තිබෙන විදේශිකයන් බාහිර ක්‍රියාකාරකම් වල යෙදෙනවිට  අවශ්‍යවන අවසර පත්‍රය
- අර්ධකාලීනව රැකියාවක් කිරීමට යන්නේ නම්, එම අවසර පත්‍රය ලබාගැනීමටත් අවසරය ලැබූ සිමාව තුල කටයුතු කිරීමටත් වගබලාගන්න



# [ප්‍රයෝජනවත් වෙබ් අඩවි]

- බහුභාෂා වෛද්‍ය ප්‍රශ්නාවලි පත්‍රය

  https://kifjp.org/medical/

- කනගාවා බහුභාෂා සහාය මධ්‍යස්ථානය

  https://kifjp.org/kmlc/

- ජීවත්වීමේ සහ රැකියා කිරීමේ මාර්ගෝපදේශක පොත (ආගමන විගමන දෙපාර්තමේන්තුව)

  - https://www.moj.go.jp/isa/guidebook_all.html

公益財団法人
かながわ国際交流財団
KANAGAWA INTERNATIONAL FOUNDATION